# TRADE AND SUPPORTING SERVICES

# (Part-I)

# වෙළෙඳාම හා උපකාරක සේවා


ව්‍යාපාරයක් විසින් සිදු කෙරෙන කටයුතු අතර ඉතාමත් වැදගත් කොටස වන්නේ වෙළෙඳාමයි.

වෙළෙඳාම පහසු කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා උපකාරක සේවාවල සහාය අත්‍යවශ්‍ය වේ.

## වෙළෙඳාම

භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීම වෙළෙඳාමයි.

වෙළෙඳාමේ දී භාණ්ඩයක හිමිකම එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට කිසියම් මූල්‍යමය වටිනාකමක් මත පදනම් ව මාරු වීමක් සිදු වේ.




ClassWork.LK

## දේශීය වෙළෙඳාම

රටක් ඇතුළත විවිධ පාර්ශ්ව අතර සිදුවන වෙළෙඳ කටයුතු සියල්ල දේශීය වෙළඳාම වේ.

දේශීය වෙළෙඳාමේ දී ගෙවීම් කටයුතු එම රටේ භාවිත වන මුදල් ඒකකවලින් සිදු කළ හැකි ය.

දේශීය වෙළෙඳාම ආකාර 2 කි.

- සිල්ලර වෙළෙඳාම
- තොග වෙළෙඳාම

## සිල්ලර වෙළෙඳාම

අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිල්ලර වෙළෙඳාම වේ.

සිල්ලර වෙළෙඳාමේ දී භාණ්ඩ ඔවුන්ට විකුණන්නේ සිල්ලර වෙළෙන්දන් ය.

උදා : සිසුවෙකු විසින් තමාට අවශ්‍ය අභ්‍යාස පොත් වෙළෙඳසලකින් මිලට ගැනීම.

ClassWork.LK

# සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ

- අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම.
- පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වේලාවට සැපයීම.
- පාරිභෝගිකයාට සමීප වීම.
- භාණ්ඩ වර්ග රාශියක් ඉදිරිපත් කිරීම.

# සිල්ලර වෙළෙඳාමේ වැදගත්කම

- පාරිභෝගිකයාට තම දෛනික අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම.
- අලෙවියට තබා ඇති නව භාණ්ඩ හඳුන්වා දීම.
- ඇතැම් විට ණයට භාණ්ඩ සැපයීම.
- නිෂ්පාදිත පිළිබඳ පාරිභෝගිකයා දක්වන ප්‍රතිචාර නිෂ්පාදකයාට දැන්වීම මගින් භාණ්ඩවල ගුණාත්වය වැඩි කිරීමට උපකාරී වීම.

ClassWork.LK

## සිල්ලර වෙළෙඳ ව්‍යාපාර වර්ග

- ස්ථාවර මහා පරිමාණ සිල්ලර වෙළෙඳසල්
  උදා : සුපිරි වෙළෙඳසල්

- ස්ථාවර සුළු පරිමාණ සිල්ලර වෙළෙඳසල්
  උදා : ග්‍රොසරිය, රූපලාවන්‍ය ආයතන

- සංචාරක සුළු පරිමාණ සිල්ලර වෙළෙඳසල්
  උදා : ජංගම රථ මගින් භාණ්ඩ අලෙවි කරන්නන්

ClassWork.LK

## තොග වෙළෙඳාම

නැවත විකිණීමේ අරමුණින් නිෂ්පාදිත මිලට ගැනීම තොග වෙළෙඳාම ලෙස හැඳින්වේ.

තොග වෙළෙඳාමේ දී භාණ්ඩ ඔවුන්ට විකුණන්නේ තොග වෙළෙන්දන් ය.

## තොග වෙළෙඳාමේ ලක්ෂණ

- නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිල දී ගැනීම.
- බොහෝ විට භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර විකිණීම.
- භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අලෙවි කිරීම.
- සාපේක්ෂ ව ඒකකයක විකුණුම් මිල අඩු වීම.
- බහුල ව වෙළෙඳ වට්ටම් ලබා දීම.

(වෙළෙඳ වට්ටම් ලබා දීම යනු භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩුකර විකිණීමයි)

ClassWork.LK

# සිල්ලර හා තොග වෙළෙඳාමේ වෙනස්කම්

| සිල්ලර වෙළෙඳාම | තොග වෙළෙඳාම |
|---|---|
| අරමුණ - අවසාන පරිභෝජනය සඳහා පාරිභෝගිකයන්ට භාණ්ඩ විකිණීමයි. | අරමුණ - නැවත විකිණීම සඳහා වෙළෙන්දන්ට භාණ්ඩ විකිණීමයි. |
| විවිධ වර්ගවල භාණ්ඩ විකුණනු ලබයි. | භාණ්ඩ වර්ග එකක් හෝ කිහිපයක් පමණක් අලෙවි කරයි. |
| සිල්ලර මිල සාපේක්ෂ ව වැඩිය. | තොග සාපේක්ෂ ව මිල අඩුය. |
| භාණ්ඩ විකිණීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලටම විකිණීම සිදු වේ. | වෙළෙඳ වට්ටම් ලබා දීම සිදු වේ. |
| සෘජු ව ගනුදෙනු කරනුයේ පාරිභෝගිකයන් සමග නිසා ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා හොඳින් හඳුනාගෙන සිටී. | සෘජු ව පාරිභෝගිකයන් සමග ගනුදෙනු නොකළ ද සිල්ලර වෙළෙන්දාගෙන් පාරිභෝගිකයන් පිළිබඳ තොරතුරු ලබා ගනී. |

ClassWork.LK

## විදේශීය වෙළෙඳාම

රටවල් දෙකක් හෝ කිහිපයක් අතර සිදුවන වෙළෙඳාම විදේශීය වෙළෙඳාම වේ.

විදේශීය වෙළෙඳාමට හේතුව වන්නේ අවශ්‍ය භාණ්ඩ හා සේවා සියල්ලෙන් ම රටක් ස්වයංපෝෂිත නොවීම සහ යම් රටක අතිරික්ත නිෂ්පාදිත විදේශ රටවලට විකිණීමට ඇති අවශ්‍යතාවයයි.

විදේශීය වෙළෙඳාමේ ප්‍රභේද 2 කි.

- ආනයන වෙළෙඳාම
- අපනයන වෙළෙඳාම

## ආනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශීය රටකින් හෝ රටවලින් භාණ්ඩ තම රටට ගෙන්වීම ආනයන වෙළෙඳාමයි.

උදා : ජපානයෙන් මෝටර් රථ මිල දී ගැනීම

## අපනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට දේශීය නිෂ්පාදිත විකිණීම අපනයන වෙළෙඳාමයි.

උදා : ශ්‍රී ලාංකික නිමි ඇඳුම් නිෂ්පාදිත යුරෝපීය රටවලට විකිණීම.

ClassWork.LK

ClassWork.LK